# සෙබළු සිතුවිලි දෙසතිය

2025
නොවැම්බර්
15 - 30

වෙළුම
LIV

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967

# වෙනස් වන ලෝකේ

සැඩ පහරට ගසාගෙන යන කොළයක් වගේ
ජීවිතේ ගලා යයි නතර නොවන ගමනේ
දැන් ඇති සුවඳ, හෙට නැති වී යයි මොහොතින්
කිසිවක් සදාකල් නොරැඳේ මේ ලෝකේ

පිපුණු මල පරව යයි සරුසාර ගසද දිරා
තරුණ කාලය මැකී යයි, මහලුව වයසට ඉරා
හැම බැඳීමක්ම වෙන් වන මොහොතකට සූදානම්
සෑම දේම වෙනස් වීම නියතයි මෙලොවේ.

අපි දකිමු මේ ලෝකය, සිතින් මවාගත් සිහිනයක් වාගේ
ඇස පිය හෙළන විට, විසුරුවා යයි දිය බුබුළක් වාගේ
අල්ලා ගෙන සිටීමෙන් දුක මිස සතුටක් නැත
අත්හැරීමේ නිදහස ලබමු, නිවනට මඟ කියන

කෝප්‍රල් ඉසුර මධුසංඛ ඩබ්ලිව්කේ
12 ගැහේබ



# හුදකලාව

ජය පරාජය
ආදරය විරහව අතර
විඩාබර දෝලනයකින්
අනතුරුව මිනිසුන්
ගිමන් නිවන
ආදරණීය නවාතැන
හුදකලාවයි................

කෝප්‍රල් පින්ශාරිකා ඩබ්ලිව්ඒපී
11 ශ්‍රීලංසංබ



# සෙබළුගේ ජීවිතය

ගෙදර අත්හැර
රටට නියම වූ වීරයා,
අඳුර මැදින් ද දහදියෙන් ද
අසීරු මඟ පියඹා.
ජීවිතය දුන්නත්
සිනහව නැතිවෙන්නේ නැහැ,
සෙබළුගේ ජීවිතය
ත්‍යාගය කිසිදා මාරු නොවේ.

**කෝප්‍රල් ශාමලා ටී**
**2(සෙවි)ශ්‍රීලයුකාබ**

# නේහා වෙත සෙනෙහසින්

පුංචි කුමරිය

ළපටි අතපය ගසමින් කුස තුළ

දැගකම් පෑ එදවස

මුල්ම හැඟුමයි ඔබ තුළින් මා ලද

නව මසක් ගත කළ ඒ සොඳුරු කාලය

කුරිරු වූ නමුදු දෛවය

නොමියන සෙනෙහස තවමත් ඇත හද තුළ

එළිය දක්නට වරම් නොලද

මා සොඳුරු සිහිනයට

**ලාන්ස් කෝප්‍රල් ජයතුංග කේජීපීසී**
**1 ශ්‍රීලයුකාබ**

# 33 වන ඒකක බලැණි සංවත්සරය

සිංහ ධජයේ අට සෙවණේ එකම ලෙසින් බැඳුණු අපේ
මහවිරුකම් පොතක ඇතේ මතක ගෙනෙන සිතුම් පෙළේ
දකින විටක සිංහ බලේ තාමත් එඩිතරයි ගතේ
සැමදා අපි සිංහ පවුලේ හොඳ නාමය මතුවට රැක්කේ....
දිවි දුන් ඒ මහ විරුවන් අදටත් අප සිත් තුළ ඇත
කාය දාන පුදා ඉන්න මහ විරුවන් නොසැලෙන
අදටත් ඒ වීර විකුම් නිර්භීතයි ලක් දෙරණට
සදා නොමැකෙනා නාමය ගල් ඉරි වූණි හද පතුලට...
යුද බිම නෑ විරුවණී අද ඔබ පුද කළ දිවි කුසුමට
සාමයේ මල් පිපෙන විටක ඔබේ සුවඳයි දැනෙන හදට
ලක් මැණී හිනැහෙනවා කඳුලු සගවලා නෙතකට
අපේ විරුවෝ තවරපු ලේ ඇති තාමත් වැලි කඳු යට....
අට ධජයේ නාමය නව ලෙල දෙනවා අහස් කුසක
දිවි පිදු විරුවන් සිහි වෙයි ලෙලෙන ධජයේ පවන් පොදක
අපේ විරුවන් සිහි කර අද තිස් තුන් වසරක ආ මග
ජන්ම දිනය සිහිකරනෙමි ඔබ සැමට මෙත් සිත් පිං වඩමින

සැරයන් උමේෂ් කුමාර ආර්සී
8 ශ්‍රීලංසිරෙ

# සෙබළ සිතුවිලි

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රකාශණයකි



ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය | www.army.lk | 011 2076967